www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපතිනිය මරන දන්ඩනය යලි ස්ථාපිත කිරීමට පියවර ගනී

## Sri Lankan president moves to reinstate the death penalty

**විජේ ඩයස් විසිනි**
**2004 නොවැම්බර් 26**

ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, මිනී මැරීම, ස්ත්‍රී දූෂනය සහ මත් ද්‍රව්‍ය ජාවාරාම යන අපරාධ සඳහා මරන දන්ඩනය යලි ක්‍රියාත්මක කිරීම පිනිස කඩතුරාවක් ලෙස පසුගිය සිකුරාදා මහාධිකරන විනිසුරුවරයකු ඝාතනය කිරීමේ සිද්ධිය ඩැහැ ගෙන තිබේ. එදින උසාවියේ රාජකාරි හමාර කොට ඔහුගේ නිවසට පෙරලා පැමිනි වහාම විනිසුරු සරත් අඹේපිටිය සහ ඔහුගේ ආරක්ෂකයා ස්වංක්‍රීය අවිවලින් වෙඩි තබා ඝාතනය කරන ලදි. හඳුනා නොගත් ඝාතකයන් වෑන් රථයකින් පලා ගිය අතර මේ වන තුරුත් පොලිස් පරීක්ෂකයන්ට සොයා ගත හැකිව ඇත්තේ හෝඩුවාවල් කිහිපයක් පමනි.

ශ්‍රී ලංකාවට යුද්ධයේ හා දේශපාලන ප්‍රචන්ඩත්වයේ ඉතිහාසයක් පවතින නමුත් අඹේපිටියගේ නිර්ලජ්ජි ඝාතනය විනිසුරුවරයකු ඝාතනය කල ප්‍රථම අවස්ථාව යි. සමහර කොලඹ මාධ්‍ය මෙය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ වැඩක් යයි වහා ම සමපේක්ෂනය කලේ ය. 1996 දී මහ බැංකුවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමෙහි ලා ඔහුගේ ක්‍රියාකලාපය වෙනුවෙන් එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ට 2002 දී අඹේපිටිය වසර 200ක සිර දඬුවමක් නියම කිරීම විශේෂයෙන් ම අවධානයට යොමු කෙරුනි.

කෙසේ වෙතත්, එල්ටීටීඊයේ සම්බන්ධයක් පෙන්වන සැලකිය යුතු සාක්ෂියක් නොමැති තතු යටතේ, පුවත්පත්වල අවධානය බොහෝ සෙයින් යොමු වූයේ රටේ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, සංවිධිත අපරාධවල මට්ටම් ඉහල යාම සහ "නීතියේ හා සාමයේ" ආරක්ෂකයකු ලෙස අඹේපිටියට පැවති පිලිගැනීම වෙත ය: ඔහු තදබල දඬුවම් නියම කිරීමට සූදානම් විනිසුරුවරයෙක් විය. ඔහුගේ ඝාතනයට නොබෝ වේලාවකට පෙරාතුව, මෙම විනිසුරුවරයා මත් ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් වරදකාරියක වූ කාන්තාවකට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම කල අතර අග විනිසුරු සරත් සිල්වාට අනුව, තීන්දුව දීමට නියමිත තවත් ඉහල මට්ටමේ මත් ද්‍රව්‍ය ජාවාරමක් පිලිබඳ නඩුවක් ඔහුගේ විනිශ්චය යටතේ පැවතුනි.

කුමාරතුංග මරන දන්ඩනය යලි ස්ථාපිත කිරීමෙහි ලා තමන්ට දිගු කලක් තිස්සේ පැවති අභිලාෂය ඉටු කර ගනු පිනිස මෙම ඝාතනය අරබයා ඇති වූ මහජන කම්පනය ක්ෂනිකව ම ගසා කෑවා ය. රටේ නීති පොත්වල දිගට ම පැවති මරන දන්ඩනය 1976 සිට මේ දක්වා ක්‍රියාත්මක කෙරුනේ නැත. ඝාතනයට පසු දින ම සිය මහජන ආරක්ෂක, නීතිය හා සාමය පිලිබඳ අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක සහ සෙසු ඉහල නිලධාරින්ගේ හදිසි රැස්වීමක් කැඳවූ ඇය මරන දන්ඩනය යලි ස්ථාපිත කරමින් ද විනිසුරුවරුන් සඳහා ආරක්ෂාව වැඩි දියුනු කරමින් ද ආඥාවක් නිකුත් කලා ය.

කුමාරතුංගගේ තීන්දුව වනාහි වැඩෙන සමාජ ආතතීන්ට හා දේශපාලන අර්බුදයට බලපෑ සැබෑ හේතුවලින් මහජන අවධානය අපසරනය කරනු වස් ප්‍රතිගාමී "නීතිය හා සාමය" පිලිබඳ පිලිවෙත්වලට ආයාචනා කිරීමේ එල්ලයෙන් යුත් නරුම පියවරකි. අපරාධ අනුපාතිකය හා මත් ද්‍රව්‍ය ඇබ්බැහිකම ඉහල යාමට බලපෑ සැබෑ හේතු පවතින්නේ, සමාජ අසමානතාව ගැඹුරු කරමින්, විශේෂයෙන් ම තරුන ජනයා අතර විරැකියාව වර්ධනය කරමින් සහ රටේ සීමිත සමාජ සේවාවන් ක්‍රමිකව බිඳ විසුරුවමින් අනුප්‍රාප්තික ආන්ඩු විසින් ක්‍රියාවට දමන ලද පිලිවෙත් තුල ය.

මෙම සියලු සාධක රටේ දිග් ගැසෙන සිවිල් යුද්ධය මගින් තවත් සංකීර්න කෙරී තිබේ. රටේ දෙමල සුලුතරයට එරෙහි විෂසෝර යුද්ධයේ තුවක්කුකරුවන් ලෙස හමුදාවට බඳවා ගැනුනු රැකියා විරහිත තරුනයන්ගෙන් බොහෝ දෙනෙක් හමුදාව අතහැර ගොස් තිබේ. එවැන්නන් 30,000ක් ඇතැයි තක්සේරු කෙරෙයි. මිලිටරි පුහුනුවකින් හා සමහර අවස්ථාවන්හි දී නවීන අවි ආයුධවලට ප්‍රවිෂ්ඨ වීමේ හැකියාවෙන් ද යුක්ත ඔවුහු මංමුලා සහගත කුලී තුවක්කුකරුවන් සංචිතයක් සම්පාදනය කරයි.

ප්‍රධාන දේශපාලන පක්ෂය ශරීර ආරක්ෂකයන් ලෙස යොදා ගැනීමට හෝ සිය දේශපාලන විරුද්ධවාදීන් ත්‍රස්ත කිරීමට හා බිය ගැන්වීමට මෙම මැරයන්ගෙන් බොහොමයක් කුලියට ගන්නා බව විවෘත රහසකි. දේශපාලනඥයන්, අපරාධකාර කල්ලි සහ පොලීසිය හා හමුදාව ඇතුලු රාජ්‍ය යන්ත්‍රය ම අතර සමීප සබඳතා ඇතිවීමට මෙම තතු තුඩු දී තිබේ. මෙම ක්‍රියාදාමය

කෙතරම් නම් විවෘත ද කිය තොත් එය පුවත්පත්වල අටුවාවන්ට විෂය වී ඇත.

නිදසුනක් ලෙස *දි අයිලන්ඩ්* පත්‍රය සිය කතුවැකියේ මෙසේ ප්‍රකාශ කලේ යඃ "අපගේ ප්‍රමුඛ දේශපාලනඥයන් මෙම අරාජකත්වයට ආසන්න තත්වයට පාර කපා ඇත. එය රහසක් නොවේ. . . . ඇමතිවරුන් හා නියෝජ්‍ය ඇමතිවරුන් අපරාධකරුවන් සමග හාදකම් පවත්වමින් ඔවුන්ගේ අනුග්‍රාහක සාන්තුවරයන් ලෙස ක්‍රියා කිරීම විධායක ජනාධිපතිවරිය ඉවසන්නේ නම් එවිට නතර කල නොහැකි ක්‍රියාදාමයක් ආරම්භ වේ. එහි ප්‍රතිඵලය වන්නේ ඉහල අමාත්‍යංශ නිලධාරීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, හමුදා ප්‍රධානීන්, මැද මට්ටමේ නිලධාරීන්ගේ පටන් පියන්ලා දක්වා සියල්ලන් ම දූෂන හා අපරාධ සමග සම්බන්ධ වීම ය."

අඹේපිටියගේ ඝාතනය අනපේක්ෂිත එකක් නොවේ යයි *ඩේලි මිරර්* පත්‍රය තියුනු විවේචනාත්මක ස්වරූපයෙන් සඳහන් කලේ යඃ "සංඥා පැහැදිලිව තිබුනි. දැවැන්ත පරිමානයකින් අධිකරනයට කෙරුනු දේශපාලන බලපෑම්, හමුදාවෙන් පැන ගිය අය දේශපාලනඥයන්ගේ පුද්ගලික ආරක්ෂකයන් ලෙස ක්‍රියා කරමින් නැටුම් ශාලාවල භාරකරුවන්ට තඩි බෑම ඇතුලු එම දේශපාලනඥයන්ගේ ආඥාවන් ඉටු කරමින් හිතුමනාපේ හැසිරීම, පාතාල ලෝකය සමග ඉහල පොලිස් නිලධාරීන් සමීප සබඳතා පැවැත්වීම සහ දේශපාලනඥයන් — කැබිනට් ඇමතිවරු පවා — පාතාල ලෝකය සමග ඉතා කිට්ටුවෙන් ඇසුරු කිරීම. එය වනාහි කුඩා රටක දේශපාලන දේහයට දරා ගත නොහැකි තරමේ මාරාන්තික විෂ මිශ්‍රනයකි."

පිලිතුරු නොදුන් ප්‍රශ්න ගනනාවක් ම අඹේපිටියගේ ඝාතනය වටා පවතින බව මෙම සන්දර්භය තුල දී අවධානයට යොමු කර ගැනීම වටනේ ය. ඝාතනයට දින තුනකට පෙර ඔහුගේ අමතර පොලිස් ආරක්ෂක භට කන්ඩායම ඉවත් කර ගැනුනි. පොලිස් නිලධාරීන්ට අනුව ඔවුන්ට මිනිස් බලයේ අඩුවක් තිබුනි. එහෙත් විනිසුරුවරයාගේ වැන්දඹුව කෝපාවිෂ්ඨව එම තීන්දුව විවේචනය කලා ය. පොලීසිය සිය ආරක්ෂක භට කන්ඩායමට සම්බන්ධිත වාර්තා පොත ඉදිරිපත් නොකරන්නේ නම් තමන් කිසිදු පරීක්ෂනයකට සහාය නොදෙන බවට ද ඇය තර්ජනය කලා ය.

අඹේපිටියගේ අධිකරන වාර්තාව මත පදනම්ව මාධ්‍ය යෝජනා කර ඇත්තේ එල්ටීටීඊයට හෝ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට ඔහුව ඝාතනය කිරීමට හේතු තිබුනා විය හැකි බව යි. එහෙත් පොලිස් හා ආරක්ෂක හමුදා ස්ථර අතර කෝපාවිෂ්ඨ ප්‍රතික්‍රියා අවුලුවාලූ බවට නිසැක සහ එබැවින් අඹේපිටියගේ ඝාතනයට සම්බන්ධ වීමෙහි ලා ඔවුන් පෙලඹුවා යැයි කිව හැකි නඩු තීන්දු ගනනාවක් සම්බන්ධයෙන් මොන ම සඳහනක් වත් කෙරී නැති තරම් ය.

අඹේපිටිය මේ සතියේ දී, දිවයිනේ උතුරේ මිරුසුවිල්හි 2000 දෙසැම්බර් 19 දා දෙමල සිවිල් වැසියන් අට දෙනකු ඝාතනයට සම්බන්ධ වීම හේතු කොට ගෙන අධිචෝදනා ලැබූ සොල්දාදුවන් පස් දෙනකු පිලිබඳ නඩුවක් විමසීමට නියමිතව තිබුනි. මිරුසුවිල් සිද්ධිය පිලිබඳව විනිසුරු මඩුල්ලක් ඉදිරියේ පැවැත්වෙන නඩුව පසුගිය වසරේ ජනවාරියේ දී අඹේපිටිය විසින් විමසීමට නියමිතව තිබූ නමුත් එක් චූදිතයකු ශ්‍රේෂ්ඨාධිකරනයට ඉදිරිපත් කල අභියාචනයකට පසුව එය වසර දෙකකට ආසන්න කාලයක් තිස්සේ ප්‍රමාද විය.

2000 වසරේ දී බිඳුනුවැව රැඳවුම් කඳවුරක දෙමල රැඳවියන් 27 දෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් පසුගිය වසරේ පොලිස් භටයන් හා සොල්දාදුවන් ගනනාවකට මරන දන්ඩනය නියම කල විනිසුරුවරයන් තිදෙනෙකුගෙන් යුත් මහාධිකරන විනිසුරු මඩුල්ලේ සභාපති වූයේ ද අඹේපිටිය යි.

## ශ්‍රී ලංකාවේ මරන දන්ඩනය

මරන දන්ඩනයට හා එයට එරෙහි මහජන විරෝධයට ශ්‍රී ලංකාව තුල දීර්ඝ ඉතිහාසයක් තිබේ. බ්‍රිතාන්‍ය විජිත අධිකාරිහු, 1815 සමස්ත දිවයිනේ ම පාලනය සියතට ගැනීමෙන් පසුව, සිංහල පාලකයන්ගේ බාදනයට ලක් වෙමින් පැවති වැඩවසම් රාජාන්ඩුවේ හිතුවක්කාරී නීතිමය ක්‍රියාදාමයන් අහෝසි කලහ. මනුෂ්‍ය ඝාතනය සඳහා මෙන් ම "(බ්‍රිතාන්‍ය) රජුට විරුද්ධව යුද්ධ කිරීම" සඳහා ද මරන දන්ඩනය පැනවීම නව අධිකරනය පද්ධතියට ඇතුලත් විය.

දේශපාලන අපරාධ සඳහා මරන දන්ඩනය පැනවීමට එරෙහිව පුලුල් විරුද්ධත්වයක් ඇවුලුනි. 1940 ගනන් හා 1950 ගනන්වල දී, එකල ට්‍රොට්ස්කිවාදී මූලධර්ම මත පදනම් වූ ලංකා සමසමාජ පක්ෂය (ලසසප), මරන දන්ඩනය අහෝසි කිරීම ඇතුලුව මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් සඳහා අරගලයේ පෙරමුනේ ම සිටියේ ය. ඇගේ පියා වූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බන්ඩාරනායක විසින් පිහිටුවන ලද කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප), "ප්‍රජාතන්ත්‍රවාදී" සහ සමහර විට "සමාජවාදී" පවා වන පූර්වනාම් සමග සිංහල ස්වෝත්තමවාදය ගැලපීම මගින් ලසසපයේ සහයෝගී පදනමට වල කැපීමට උත්සාහ කලේ ය.

බන්ඩාරනායක 1956 දී බලයට පත් වූයේ "සිංහල පමනක්" රාජ්‍ය භාෂාව කල යුතු ය යන වර්ගෝත්තමවාදී ඉල්ලීමේ පදනම මත ය. එහෙත් සිය ආන්ඩුවට ප්‍රගතිශීලී ආටෝපයක් දීමට ද ඔහු උත්සාහ කලේ ය. ඔහු මරන දන්ඩනය අත්හිටවූ නමුත් ඔහු ඔවුන්ගේ ස්වෝත්තමවාදී ඉල්ලීම් ක්‍රියාවට දැමීමට අපොහොසත් වීම පිලිබඳව උදහස් වූ ඔහුගේ ම පක්ෂය තුල කල්ලියක් සහ බෞද්ධ ධුරාවලියේ ස්ථරයක් විසින් 1959 දී බන්ඩාරනායක ඝාතනය කරනු ලැබීමෙන් පසුව එය වහා ම යලි ස්ථාපිත කෙරුනි.

මරන දන්ඩනය අත්හිටුවීම පිලිබඳව 1956 පැවති පාර්ලිමේන්තු විවාදයක් තුල දී ලසසප නායක කොල්වින් ආර්. ද සිල්වා ව්‍යක්ත ලෙස පැහැදිලි කලේ

අපරාධ වනාහි අයුක්ති සහගත සමාජයක ප්‍රතිඵල වන අතර මරන දන්ඩනය අති මූලික සමාජ ප්‍රතිසංස්කරනයන්ට බාධාවක් ලෙස පවතින බව යි.

"සමාජය එම සමාජයේ සෑම තනි සාමාජිකයකු ම සම්බන්ධයෙන් වගකීම භාර ගත යුතු ය යන වගකීමට අප මුහුන නො දෙන්නේ නම්, එවන් මිනිසකු නිර්මානය කරන එවන් සමාජ පසුබිමක සහ සන්දර්භයක, පෝෂන, අධ්‍යාපනික, ආර්ථික හා මනෝවිද්‍යාත්මක තතුවල පැවැත්ම අප ඉවසා ඇති තාක් දුරට, සෑම මිනිස් ඝාතනයක දී ම, එම ඝාතනයේ කොටස්කරුවකු ලෙස අප ද සිටී යන කරුනට මුහුන දීමට අප සූදානම් නො වේ නම්, අප එය අවබෝධ කර ගන්නේ නැති නම්, අපි මරන දන්ඩනය පිලිබඳ මෙම ප්‍රශ්නයට කිසි දාක නියමාකාරයෙන් මුහුන නොදෙන්නෙමු." යයි ඔහු පැවසී ය.

1965 වන විට, ලසසප, ශ්‍රීලනිපයට මුලුමනින් ම යටත් වී, සිය ජාත්‍යන්තර සමාජවාදී මූලධර්ම පාවා දී, බන්ඩාරනායකගේ වැන්දඹුවගේ නායකත්වයෙන් යුත් ධනේශ්වර ආන්ඩුවට එක් විය. එහෙත්, කෙසේ වෙතත්, ලසසපය ගෙන ගිය දේශපාලන අරගලය, මරන දන්ඩනය ඇතුලු ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරන්ට වැඩ කරන ජනතාව අතර අඛන්ඩ විරෝධයක් නිර්මානය කලේ ය. ජේ.ආර්. ජයවර්ධනගේ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂ ආන්ඩුවට පවා, 1978 සිය ඒකාධිපති ව්‍යවස්ථාව තුල මරන දන්ඩනය යොදා ගැනීම සම්බන්ධයෙන් යම් සංශෝධනයක් කිරීමට බල කෙරුනි.

නව නෛතික සැකැස්මට අනුව, රාජ්‍ය මරන දන්ඩනය ක්‍රියාවට දැමිය හැකි වන්නේ නඩුවේ විනිසුරුගේ, නීතිපතිගේ සහ අධිකරන ඇමතිගේ ඒකමතික අනුමැතිය යටතේ පමනි. එවන් එකඟතාවක් නොමැති තන්හි දී දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට ලිහිල් කිරීමට නියමිත විය. මරන දන්ඩනය ක්‍රියාවට දැමීමට පලමුව, එයට අවසන් වසයෙන් ජනාධිපතිගේ අනුමැතිය ද ලැබිය යුතු විය. මෙය වනාහි යථා වසයෙන් මරන දඬුවම් ක්‍රියාවට දැමීම නතර කල විධි වගන්තියකි. අවසන් වරට පුද්ගලයකු එල්ලා මරන ලද්දේ 1976 දී ය.

කෙසේ වෙතත්, පසුගිය දශකය තිස්සේ ම, ජනාධිපති කුමාරතුංග මරන දන්ඩනය යලි ස්ථාපිත කරනු පිනිස ප්‍රයත්න ගනනාවක් ම දරා තිබේ. යුද්ධය අවසන් කිරීමට අපොහොසත් වීම සහ ජීවන මට්ටම් එක දිගට ම කඩා වැටීම සම්බන්ධයෙන් වැඩෙන මහජන විරුද්ධත්වයකට මුහුන දුන් තතු යටතේ, ඇය සහ ඇගේ සහාග ආන්ඩුව, තමන්ගේ කඩ කල පොරොන්දුවලින් සහ බොරුවලින් මහජන අවධානය වෙනතකට යොමු කරනු සඳහා දක්ෂිනාංශික "නීතිය හා සාමය" පිලිබඳ ගොඩ බෙහෙත් දෙසට හැරුනි. බොහෝ සෙයින් අපකීර්තියට පත්ව හිස් කෝම්බයකට වැඩි යමක් නො වන ලසසපය, එම පිලිවෙතට මොන යම් හෝ බාධාවක් එල්ල කොට නැත.

1999 මාර්තුවේ දී, ඇය සිය ප්‍රථම නිල කාලයේ අවසානය කරා ලඟා වෙද්දී, කුමාරතුංග පලාත් සභා මැතිවරන රැස්වීමක දී වාචාල ලෙස මෙසේ ප්‍රකාශ කලා යː "අපරාධ අනුපාතිකය ඉහල යමින් පවතී. මෙය මනුෂ්‍ය ජීවිත පිලිබඳ කිසිදු තැකීමක් නැති අපරාධකාරයන් සම්බන්ධයෙන් අනුකම්පා කිරීමට කාලය නො වේ. එනිසා මගේ ආන්ඩුව මරන දන්ඩනය යලි ස්ථාපිත කිරීමට තීන්දු කලා." පුලුල් විරෝධතාවන්ට මුහුන දුන් තතු යටතේ එම තීන්දුව හකුලා ගැනීමට ඇයට බල කෙරුනි. එතැන් පටන් එම කාරනාව අවිනිශ්චිත තත්වයෙන් පැවතී ඇතː එනම්, එකදු මරන දන්ඩනයක් වත් ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට ලිහිල් කෙරී නැති අතර එහෙත් එකදු මරන දන්ඩනයක් වත් ක්‍රියාවට ද දමා නැත.

2001 සිට 2004 අප්‍රේල් දක්වා බලයේ සිටි එජාප නායකත්වයෙන් යුත් සහාග ආන්ඩුව ද 2003 දී මරන දන්ඩනය පුනස්ථාපනය කිරීමට පියවර ගති. එහෙත් සිය ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත්වල බලපෑම හේතු කොට ගෙන පුලුල් විරෝධතාවන්ට මුහුන දුන් තතු යටතේ එම ආන්ඩුව ද සිය සැලසුම ක්‍රියාවට දැමීමට අපොහොසත් බව ඔප්පු විය. ඇගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) සහාගය අප්‍රේල් මැතිවරනයෙන් ජය ගැනීමෙන් පසුව, කුමාරතුංග දැන් එය ම ක්‍රියාවට දැමීමට ප්‍රයත්න දරයි.

© www.wsws.org